ඉඩම් අමාත්‍යාංශය

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මැනුම් ක්ෂේත්‍ර සහයකයින් සඳහා වූ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම - 2 (NVQ Level 2)**
**පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම - 2021**

01. මැනුම් ක්ෂේත්‍ර සහයකයින් සඳහා වන ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම - 2 (NVQ Level - 2) පාඨමාලාව සඳහා පහත සුදුසුකම් සපුරාලන ලද අපේක්ෂකයින් අතරින් අයදුම්පත් කැඳවනු ලැබේ. :-

(අ) මනා චරිතයකින් යුක්ත විය යුතුය.
(ආ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ඇ) වයස අවුරුදු 18ත් 45ත් අතර විය යුතුය.
(ඈ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථයන් දෙකක් සහිතව විෂයයන් හයකින් සමත් විය යුතුය. අදාළ සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

02. සෑම අයදුම්කරුවෙකුම මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව 11.7" x 8.3" (A4) ප්‍රමාණයේ කඩදාසියක අදාළ අයදුම්පත්‍රය සකස් කර තම අත් අකුරින්ම සියලු තොරතුරු සම්පූර්ණ කර සුපුරුදු අත්සන යෙදිය යුතුය. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක බහා එම කවරයේ ඉහළ වම් කෙළවරෙහි ඉල්ලුම් කරන පාඨමාලාවේ නම ''NVQ Level -2 : 2021'' ලෙස සඳහන් කොට 2020.12.28 දිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අධ්‍යක්ෂ,
මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය,
දියතලාව.

03. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. (අ) මෙම පාඨමාලාව සිංහල/දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.
(ආ) පාඨමාලාව සඳහා සුදුස්සන් තෝරා ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක් මගිනි. එහිදී අයදුම්කරුවන් විසින් ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල මත අවශ්‍ය සිසුන් තෝරා ගැනේ. පාඨමාලාව සඳහා තෝරා ගනු ලබන සිසුන්ගේ නාම ලේඛනය ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙහි (www.survey.gov.lk) ප්‍රසිද්ධ කරනු ලැබේ.
(ඇ) පාඨමාලාව හදාරන කාලය තුළදී පුහුණුලාභීන්ට කිසිදු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

05. පාඨමාලාවේ මුළු කාලය සති 12 කි. එය පහත දක්වා ඇති පරිදි මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ සති 2ක පූර්ණ කාලීන නේවාසික පාඨමාලාවකින්ද, ක්ෂේත්‍රයේ සති 10ක ප්‍රායෝගික පුහුණුවකින්ද යුක්ත වේ. මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ නේවාසික කාලය සඳහා වැයවන වියදම් ලෙස එක් පුහුණුලාභියකුගෙන් රු. 5,000 ක් අයකරනු ලබන අතර තෝරාගත් පුහුණුලාභීන් පාඨමාලාව ආරම්භක දිනයේදීම එම මුදල මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය වෙත ගෙවා රිසිට් පතක් ලබාගත යුතුය.

| අදියර | කාලය | පැවැත්වෙන ස්ථානය | නවාතැන් | ආහාරපාන |
|---|---|---|---|---|
| 1 | සති 2 | ''මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය'' දියතලාව (පූර්ණ කාලීන නේවාසික පාඨමාලාව) | නේවාසික පහසුකම් ලබාදේ | සපයාගත යුතුය. (ආපන ශාලා පහසුකම් ඇත.) |
| 2 | සති 10 | ක්ෂේත්‍රයේ පිහිටි ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයන්ට අනුබද්ධව ප්‍රායෝගික පුහුණුව | සපයාගත යුතුය | සපයා ගත යුතුය. |

06. පුහුණුව අවසානයේ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පවත්වනු ලබන ලිඛිත/ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් සිසුන්ගේ දැනුම පරීක්ෂා කර ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම - 2 ට අදළ සහතිකය නිකුත් කරනු ලැබේ.

07. අසත්‍ය හෝ වංචනික ලේඛන ඉදිරිපත් කර ඇති බව තහවුරු වුවහොත් එම අයදුම්කරුවන් පාඨමාලාව සඳහා නුසුදුස්සන් සේ සලකනු ලැබේ.

08. පුහුණුව අවසන් කළ පසු රැකියාවක් ලබාදීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට කිසිදු වගකීමක් හෝ බැඳීමක් නොමැති අතර, පාඨමාලාව සාර්ථකව සම්පූර්ණකර ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම - 2 (NVQ - 2) සුදුසුකම් ලබා ගන්නා තැනැත්තන්ට මැනුම් ක්ෂෙත්‍ර සහයකයන් බඳවා ගැනීමේ විභාගයක් පවත්වන අවස්ථාවක ඊට අවශ්‍ය වෘත්තීය සුදුසුකම පමණක් මෙමගින් සැපිරේ.

09. පාඨමාලාව සඳහා බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය සර්වේයර් ජනරාල් විසින් තීරණය කරනු ඇත.

ඒ. එල්. ශ්‍යාමලී චිත්‍රලේඛා පෙරේරා,
සර්වේයර් ජනරාල්.

ආදර්ශ අයදුම්පත්‍රය

**මැනුම් ක්ෂෙත්‍ර සහයකයින් පුහුණු කිරීම සඳහා වන ''ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 2 ( NVQ Level 2) පාඨමාලාව - 2021'' සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ අයදුම්පත්‍රය**

01. මුලකුරු සමග නම :————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම :————.

03. ස්ථිර ලිපිනය :————.

04. සම්බන්ධ කරගත හැකි දුරකථන අංක ෑ ස්ථාවර :————. ජංගම :————.

ඊ-මේල් :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :————.

06. දිස්ත්‍රික්කය :————.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

07. උපන් දිනය :————. 2020.12.28 වැනි දිනට වයස ෑ
(අවුරුද්ද/මාසය/දිනය) අවුරුදු :————. මාස :————. දින :————.

08. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

09. අධ්‍යාපන සුදුසුකම් ඃ

(අ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ප්‍රතිඵල (දෙවරකට නොවැඩි වාර ගණනකදී) ඃ

| විභාග අංකය | විභාගයට පෙනී සිටි වර්ෂය | විභාගයට පෙනී සිටි විෂයයන් | ලබාගත් ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටියේ නම් එම ප්‍රතිඵල ඃ

| විභාග අංකය | විභාගයට පෙනී සිටි වර්ෂය | විභාගයට පෙනී සිටි විෂයයන් | ලබාගත් ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

10. මීට පෙර NVQ පාඨමාලාවක් හදාරා තිබේනම් එම පාඨමාලාවේ විස්තර ඃ
පාඨමාලාවේ අංකය/සංකේතය :————.

NVQ මට්ටම :————.

ආයතනය :————.

11. අයදුම්කරුගේ ප්‍රකාශය ඃ

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, ඉල්ලුම් කොට ඇති පාඨමාලාවට අවශ්‍ය සුදුසුකම් මා සපුරා ඇති බවත්, මෙයින් සහතික කරමි. තවද මෙම පාඨමාලාව සම්බන්ධ ඇති සියලු නීති රීති වලට අනුව ක්‍රියා කිරීමටද, සර්වේයර් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය ලෙස පිළිගැනීමටද එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.